# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන)

**2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

මුදල් අමාත්‍යතුමා විසින් 2015 සැප්තැම්බර් මස 22 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 මාර්තු මස 30 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[3 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 11.00 යි** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 009233—475 (2015/09)

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ:—

(අ) මූල්‍ය සේවා සැපයීම සම්බන්ධයෙන්, බදු ගෙවීම හඳුනා ගැනීම සඳහා නව ගණනය කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීම;

(ආ) දේපළ වෙළඳාමේ සහ දේපළ සංවර්ධන කටයුතුවල යෙදී සිටින තැනැත්තන්ගේ එකී ව්‍යාපාරික කටයුතු මත උපචිතවන ආදායම සඳහා බදු අය කිරීම වෙනුවෙන් වගකීමක් පැනවීම; සහ

(ඇ) ඇතැම් අයිතමයන් බදු ගෙවීමේ වගකීමෙන් නිදහස් කිරීම වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ නිෂ්පාදකයකු නොවන්නා වූ යම් තැනැත්තකු මේ පනත යටතේ බදු බැරකිරීම් ලැබීම් සඳහා හිමිකම් ලැබීමෙන් බැහැර කිරීම වේ.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 6අ අලුත් වගන්තියක් ඇතුළත් කරනු ලබන අතර එමගින් ඉලෙක්ට්‍රොනික සන්නිවේදන කටයුතු හා ඉලෙක්ට්‍රොනික වාර්තා භාවිත කිරීම සඳහා පහසුකම් සලසනු ලැබේ.

***5 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ "සේවය" යන යෙදුමේ අර්ථ නිරූපණය ප්‍රතියෝජනය කිරීම වේ.

***6 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමු උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත උපලේඛනයේ නීතියේ බලපෑම වනුයේ ඇතැම් අයිතම සම්බන්ධයෙන් නිදහස් කිරීමේ වර්තමාන නිර්ණායක ප්‍රතිශෝධනය කිරීම වේ.

***7 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ඇතැම් විධිවිධාන බලාත්මක වන දිනයන් නිශ්චිතව සඳහන් කරනු ලබයි.

***8 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් 2015 ජනවාරි 01 වන දින සිට ආරම්භව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී බදු එකතු කිරීම සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස්වරයා හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉටු කරනු ලබන කාර්යය වලංගු කරනු ලැබේ.

# ජාතිය ගොඩනැගීමේ බදු පනත (සංශෝධන)

එල්.ඩී.—ඕ. 14/2015

**2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** (1) මේ පනත 2015 අංක      දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර වෙන් වශයෙන් වූ ක්‍රියාත්මක වීමේ දිනයන් නිශ්චිතව සඳහන් කර ඇත්නම් මිස මෙම පනත 2015 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.*

(2) 6 ආ වගන්තියේ විධිවිධාන අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක සිට බලාත්මක විය යුතු ය.

**2.** 2014 අංක 10 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

*2009 අංක 9 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(1) එම වගන්තියේ 2 වන උපවගන්තියේ -

(අ) එහි (iii) වන ඡේදයේ පළමුවන අතුරු විධානය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්-

"එසේ වුව ද, මෙම පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද මූල්‍ය සේවා සැපයීමේ ව්‍යාපාරය පවත්වාගෙන යන යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ යම් මූල්‍ය සේවාවක් සැපයීමෙන් ලබන්නා වූ බද්දට යටත් පිරිවැටුම-

(අ) 2014 සැප්තැම්බර් 30 වන දිනට හෝ එදිනට පෙර අවසන්වන යම් කාර්තුවක් සඳහා සහ 2014 ඔක්තෝබර් මස 01 වන දින ආරම්භ වී 2014

2—PL 008879—450 (2015/03)

ඔක්තෝබර් මස 24 වන දිනෙන් අවසන්වන කාල සීමාව තුළ මූල්‍ය සේවා සැපයීම සම්බන්ධයෙන් එකතු කළ අගය මත බදු ගෙවීම පිණිස 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25ඇ වගන්තියේ (5) වන උපවගන්තිය සමග කියවිය යුතු (4) වන උපවගන්තියේ සඳහන් අදාළ ක්‍රමය යොදා ගැනීමේ කාර්යය සඳහා ගණනය කරනු ලැබුවා වූ ද එසේ මූල්‍ය සේවය සඳහා යොදා ගනු ලබන්නා වූ ද එකතු කළ අගය විය යුතු ය; සහ

(ආ) 2014 ඔක්තෝබර් මස 25 වන දින ආරම්භ වී 2014 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන යම් කාලයක් සඳහා සහ 2015 ජනවාරි මස 01 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් කාර්තුවක් සඳහා 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25අ වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් සැපයුමක වටිනාකමඃ

එසේ වුව ද, එම මූල්‍ය සේවාවට යොදාගනු ලබන අගය එකතු කිරීම මේ පනතේ කාර්ය සඳහා මූල්‍ය සේවා ව්‍යාපාරය සම්බන්ධයෙන් බදු ගෙවීම පිණිස 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25ඇ වගන්තියේ (5) වන උපවගන්තිය සමග කියවිය යුතු (4) වන උපවගන්තියේ සඳහන් අදාළ ක්‍රමය අදාළ කර ගැනීම මගින් සිදු කළ යුතු ය";

(ආ) එහි (iii) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීම මගින්:—

"(iiiඅ) මෙහි (iii) ඡේදයේ කාර්ය සඳහා, 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට දේපළ වෙළඳාම සහ එය වැඩි දියුණු කිරීමේ ව්‍යාපාරය මත උපචිත වන නමුත් පළමු වන උපලේඛනයේ සඳහන් නිදහස් කරන ලද සේවා හැර 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 5 වන වගන්තියේ (7) වන උපවගන්තියේ කාර්යය සඳහා නිශ්චිතව ගණනය කරන ලද එම සේවාවේ වටිනාකම අදහස් වේ";

(ඇ) එහි (iv) වන ඡේදයේ-

(i) (9) වන උප ඡේදයේ ඇති "සිල්ලරට විකිණීම; සහ" යන වචන වෙනුවට "සිල්ලරට විකිණීම" යන වචන ආදේශ කිරීමෙන්;

(ii) (10) වන උපඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේද ආදේශ කිරීමෙන්:—

"(10) එල්.පී. ගෑස්;

(11) රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ හඳුනාගනු ලැබුවා වූ ද, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ ආනයනය කිරීමේ දී නිෂ්පාදන බදු ගෙවීමට යටත් වන්නා වූ ද, 2014 ඔක්තෝබර් මස 25 වන දිනයෙන් පසුව ආනයනය කරනු ලැබුවේ නම් ඉහත කී නිෂ්පාදන බදු ගෙවීමට යටත් විය හැකිව තිබුණා වූ ද 2014 ඔක්තෝබර් මස 25 වන විට විකුණා නොමැතිව පවතින වාහන ද ඇතුළුව යම් මෝටර් වාහනයක් එහි ආනයනකරු විසින් ම විකුණනු ලබන තාක්දුරට, එකී මෝටර් වාහනය;

(12) රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ හඳුනාගනු ලබන්නා වූ ද ලැබුවා වූ ද ආනයනය කිරීමේ 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිෂ්පාදන බදු ගෙවීමට සහ 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ සෙස් බදු ගෙවීමට යටත් වන්නා වූ ද 2014 ඔක්තෝබර් මස 25 වන දිනයට පසුව ආනයනය කරනු

ලැබුවේ නම්, ඉහත කී නිෂ්පාදන බදු සහ සෙස් බද්ද ගෙවීමට යටත් විය හැකිව තිබුණා වූ ද, 2014 ඔක්තෝබර් මස 25 වන දිනය වන විට විකුණා නොමැතිව පවතින සිගරට් තොග ද ඇතුළු සිගරට්, ආනයනකරු විසින් ම විකුණනු ලබන තාක් දුරට, එම සිගරට්; සහ

(13) රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ හඳුනාගනු ලැබුවා වූ ද ආනයනය කිරීමේ දී 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත යටතේ රේගු බදු ගෙවීමට සහ 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ සෙස් බදු ගෙවීමට යටත් වන්නා වූ ද 2014 ඔක්තෝබර් මස 25 දිනයට පසුව ආනයනය කරනු ලැබුවේ නම් ඉහත කී රේගු බදු සහ සෙස් බදු ගෙවීමට යටත් විය හැකිව තිබුණා වූ ද, 2014 ඔක්තෝබර් මස 25 දිනය වන විට විකුණා නොමැතිව පවතින්නා වූ ද මත්පැන් ද ඇතුළුව මත්පැන්, ඒවා ආනයනය කරනු ලබන තැනැත්තා විසින් ම විකුණනු ලබන තාක් දුරට, එම මත්පැන්.”

(2) එහි (4) උපවගන්තියේ, (iii) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

“(iii) (iv) වන ඡේදයේ සඳහන් සේවා හැර, භාණ්ඩ හෝ සේවා සැපයීමෙන් ඒ තැනැත්තා ගේ බද්දට යටත් පිරිවැටුම-

(අ) අදාළ කාර්තුව 2011 ජනවාරි මස 01 දින හෝ එදිනට පසුව ආරම්භ වී එහෙත් 2013 ජනවාරි

මස 01 දිනට හෝ එදිනට පෙර වූ යම් කාර්තුවක් වන විට, රුපියල් පන් ලක්ෂයක් නොඉක්මවන්නේ නම්;

(ආ) අදාළ කාර්තුව 2013 ජනවාරි මස 01 දින හෝ එදිනට පසුව ආරම්භ වී එහෙත් 2015 ජනවාරි මස 01 දිනයට පෙර වූ යම් කාර්තුවක් වන විට, රුපියල් මිලියන තුනක් නොඉක්මවන්නේ නම්; සහ

(ඇ) අදාළ කාර්තුවක් 2015 ජනවාරි මස 01 වන දිනට හෝ එදිනට පසුව ආරම්භ වන කාර්තුවක් වනවිට රුපියල් තිස් හත් ලක්ෂ පනස් දහසක් නොඉක්මවන්නේ නම්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** 2012 අංක 9 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ අවසානයට ඇති අතුරු විධානයේ "මුදල් පෙර ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු ය." යන වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීම මගින් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"මුදල් පෙර ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු යඃ

එසේ ම තවදුරටත් කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ වැඩිපුර ගෙවන ලද මුදල එම නිෂ්පාදකයා හැර, වෙනත් තැනැත්තකු විසින් 4 වන වගන්තිය යටතේ ගෙවන ලද බදු මුදල් පෙර ගෙවීමක් ලෙස සලකනු නොලැබිය යුතු අතර හිලව් කරන ලද මුදල යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයෙන් ලැබෙන පිරිවැටුම මත වූ බදු ගෙවීමේ වගකීම ඉක්මවා ව්‍යාප්ත නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 6ආ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය 6 ආ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය:—

"ඉලෙක්ට්‍රොනික සන්නිවේදන ඉලෙක්ට්‍රොනික වාර්තා භාවිතා කිරීම.

6 ආ. 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 8 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කරුණු සඳහා ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා භාවිතා කිරීම සඳහා බලය ලබාදීමේ හෝ පහසුකම් සැලසීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් දේශීය ආදායම්

කොමසාරිස් ජනරාල්වරයාගේ නිර්දේශය මත, නියෝග සාදනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** 2011 අංක 10 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ සේවා යන යෙදුමේ අර්ථකථනය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් එම වගන්තිය තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

""සේවා" යන්නට යම් දේපළ වෙළදාම් සහ ඒවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපාරයක් ද ඇතුළත් වන නමුත් 2011 ජනවාරි මස 01 වන දිනට පෙරාතුව අවසන් වූ යම් කාලසීමාවක් සඳහා මේ පනතේ පළමු වන උපලේඛනයේ II වන කොටසේ නිශ්චිතව දැක්වෙන නිදහස් කරන ලද යම් සේවාවක් ඇතුළත් නොවේ; සහ".

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

**6.** 2014 අංක 10 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම උපලේඛනයේ I වන කොටසේ-

(අ) (xxvi) අයිතමය වෙනුවට පහත දැක්වෙන අලුත් අයිතමය ආදේශ කිරීමෙන්:—

"(xxvi) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සඳහන් කරනු ලැබිය හැකි නියම හා කොන්දේසිවලට යටත්ව-

(අ) 2015 ජනවාරි මස 01 වන දිනයට පෙරාතුව සාම්පල ආනයනය කරනු ලැබූ අවස්ථාවක දී රුපියල් විසි පන්දහසකට; සහ

(ආ) 2015 ජනවාරි මස 01 වන දින හෝ එදිනට පසුව සාම්පල ආනයනය කරනු ලැබූ අවස්ථාවක දී රුපියල් පනස් දහසකට,

වඩා වැඩි නොවන ව්‍යාපාරයකට අදාළව ආනයනය කරන ලද සාම්පල්;";

(ආ) (XLV) අයිතමය වෙනුවට පහත දැක්වෙන අලුත් අයිතමය ආදේශ කිරීමෙන්:—

"(XLV) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා විදුලිබල මණ්ඩලය විසින් හෝ එකී මණ්ඩලය සමග විදුලි බලය සැපයීම සඳහා ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් ආයතනයක් විසින් විදුලි බලය උත්පාදනය කිරීමේ කාර්ය සඳහා ආනයනය කරනු ලබන්නා වූ හෝ දේශීය වශයෙන් මිල දී ගන්නා වූ ද රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරනු ලැබුවා වූ ද, මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ ;";

(ඇ) (XLVI) අයිතමයේ "දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද පොල්තෙල්." යන වචන වෙනුවට "දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද පොල්තෙල්;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඈ) (XLVI) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතම ආදේශ කිරීමෙන්:—

"(XLVII) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වරාය ඇතුළත පමණක් භාවිතා කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ආනයනය කරනු ලබන යන්ත්‍රෝපකරණ, උපකරණ හෝ අමතර කොටස්;

(XLVIII) රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ හඳුනාගනු ලැබුවා වූ ද ආනයනය කිරීමේ දී 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිෂ්පාදන බදු ගෙවීමට යටත් වන්නා වූ ද, 2014 ඔක්තෝබර් මස 25 වන දිනය වන විට විකුණා නොමැතිව නිෂ්පාදකයා සන්තකයේ පවතින්නා වූ ද එදිනට පසුව නිෂ්පාදනය කරන ලද්දේ නම් නිෂ්පාදනය කිරීමේ දී ඉහත කී බද්දට ම යටත් විය හැකිව තිබුණා වූ ද මෝටර් වාහනයක් ද ඇතුළුව, මෝටර් වාහනයක්;

(XLIX) රේගු කාර්ය සඳහා ඒ නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ හඳුනාගනු ලැබුවා වූ ද, අවස්ථාවෝචිත පරිදි, ආනයනය කිරීමේ දී හෝ සිගරට් නිෂ්පාදනය මත 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිෂ්පාදන බදු ගෙවීමට සහ 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ සෙස් බදු ගෙවීමට යටත් වන්නා වූ ද 2014 ඔක්තෝබර් මස 25 වන දිනයට පසුව සිගරට් නිෂ්පාදනය කරනු ලැබුවේ නම්, එම නිෂ්පාදනය මත ඉහත කී බද්දට ම යටත් විය හැකිව තිබුණා වූ ද 2014 ඔක්තෝබර් මස 25 වන දිනය වන විට විකුණා නොමැතිව පැවතියා වූ ද, නිෂ්පාදනය කරන ලද සිගරට් ඇතුළුව, සිගරට්;

(XLX) රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ හඳුනාගනු ලැබුවා වූ ද අවස්ථාවෝචිත පරිදි, ආනයනය කිරීමේ දී හෝ සිගරට් නිෂ්පාදනය මත 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිෂ්පාදන බදු ගෙවීමට සහ 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ සෙස් බදු ගෙවීමට යටත් වන්නා වූ ද, 2014 ඔක්තෝබර් මස 25 වන දිනයට පසුව මත්පැන් නිෂ්පාදනය කරනු ලැබුවේ නම්, එම නිෂ්පාදනය මත ඉහත කී බද්දට යටත් විය හැකිව තිබුණා වූ ද 2014 ඔක්තෝබර් මස 25 වන දිනය වන විට විකුණා නොමැතිව පැවතියා වූ ද නිෂ්පාදනය කරන ලද මත්පැන් ද ඇතුළුව, මත්පැන්.”.

(2) එම උපලේඛනයේ II කොටසෙන්-

(අ) එහි (vi) වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අලුත් අයිතමය ආදේශ කිරීමෙන්:—

“(vi) 2014 ඔක්තෝබර් 25 වන දිනට පෙරාතුව එළඹුන යම් මූල්‍ය කල්බදු ගිවිසුමක් මත යම් වංචල දේපළක් සම්බන්ධයෙන් මූල්‍ය කල්බදු පහසුකම් සැලසීම;”

(ආ) එහි (vii) අයිතමය වෙනුවට පහත දැක්වෙන අලුත් අයිතමය ආදේශ කිරීමෙන්:—

“(vii) ගොඩනැගිලි, පාරවල්, පාලම්, ජල සැපයුම, ජලය හෝ මල ප්‍රවාහන පද්ධති, වරාය, ගුවන් තොටුපල, ඉදිකිරීම් හෝ විදුලි සංදේශ හෝ විදුලි බලය පිළිබඳ යටිතල පහසුකම් පිළිබඳ ව්‍යාපෘතිය සම්බන්ධ ඉදිකිරීම් වනතාක් දුරට,

(අ) උප කොන්ත්‍රාත්කරුවකු නොවන ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු 2011 ජනවාරි මස 01 වන දිනයට පෙරාතුව සලසන ලද සේවා; හෝ

(ආ) ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු හෝ උපකොන්ත්‍රාත්කරුවකු 2011 ජනවාරි මස 01 වන දින හෝ එදිනට පසුව සලසන සේවා;";

(ඇ) එහි (xiii) වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අලුත් අයිතමය ආදේශ කිරීමෙන්:—

"(xiii) යම් දේශීය නිෂ්පාදන ද්‍රව්‍යයක වෙන්දේසිකරුවකු, තැරැව්කරුවකු, රක්ෂණ නියෝජිතයකු හෝ කොමිස් නියෝජිතයකු විසින් සපයනු ලබන සේවා සඳහා අවස්ථාවෝචිත පරිදි එම වෙන්දේසිකරුවකුට හෝ තැරැව්කරුට ලැබෙන කොමිස් හෝ කොමිස් නියෝජිතයාට හෝ රක්ෂණ නියෝජිතයාට ලැබෙන තැරැව්කාර ගාස්තුවේ ප්‍රමාණය අනුව එම සේවා;";

(ඈ) එහි (xxviii) වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අලුත් අයිතමය ආදේශ කිරීමෙන්:—

"(xxviii) 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත යටතේ විදුලි සංදේශ බදු ගෙවීමට යටත් වන විදුලි සංදේශ සේවා සහ එම පනතෙහි විදුලි සංදේශ සේවා අර්ථකථනය කිරීමේ දී එම බදු ගෙවීමෙන් විශේෂයෙන් බැහැර කරන ලද සේවා. (2014 ජනවාරි මස 01 වන දින සිට බලපවත්වන පරිදි)

(ඉ) එහි (xxxvi) වන අයිතමයේ "ඉටුකරනු ලබන යම් සේවාවක්; සහ" යන වචන වෙනුවට "ඉටුකරනු ලබන යම් සේවාවක්;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඊ) එහි (xxxvii) අයිතමයේ "සපයනු ලබන සේවා." යන වචන වෙනුවට "සපයනු ලබන සේවා; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(උ) (xxxvi) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය ඇතුළත් කිරීමෙන්:—

"(xxxviii) පදිංචිය සඳහා නිවාස පහසුකම් සැලසීමට අදාළ ඉදිකිරීම් ව්‍යාපෘතියේ වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන දහයකට හෝ වෙනත් යම් ව්‍යාපාර මුදලකට අඩුවන තාක් දුරට පදිංචිය සඳහා නිවාස පහසුකම් ඉදිකිරීම සහ විකිණීම පිළිබඳ වන දේපල වෙළදාම් හෝ ඒවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපාරය."

පසු කාලයට බලපෑම.

**7.** මේ පනතේ, 3(2) (iv) වගන්තියේ (11), (12) සහ (13) උපඡේද සහ පළමුවන උපලේඛනයේ I වන කොටසේ ( XLVIII) ( XLIX ) සහ (XLX) යන අයිතම සියලු කාර්ය සඳහා 2014 ඔක්තෝබර් මස 25 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු අතර මේ පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසේ (xxviii) අයිතමය 2014 ජනවාරි මස 01 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

වලංගු වීම.

**8.** 2015 ජනවාරි මස 01 දිනයෙන් ආරම්භ වී මෙම පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලැබූ දිනයෙන් අවසන් වන කාල සීමාව තුළ දී මේ පනතේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ගණනය කරනු ලැබූ බදු මුදල ප්‍රධාන ප්‍රඥප්තියේ පිළිවෙලින් 4 වන හෝ 5 වන වගන්තිවල විධිවිධාන යටතේ අවස්ථාවෝචිත පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මේ පනතේ විධිවිධාන අදාළ වන යම් තැනැත්තකුගෙන් එකතු කරනු ලබන අවස්ථාවක දී එම එකතු කිරීම සියලු කාර්ය සඳහා වලංගු ලෙස සලකනු ලැබිය යුතු යඃ

එසේ වුව ද මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන ඉහත කී කාල සීමාව තුළ එකතු කරන ලද යම් බද්දක් සම්බන්ධයෙන් අධිකරණයකින් දෙන ලද තීරණයකට හෝ යම් ආඥාවකට හෝ

අධිකරණයක අවසන් නොවී පවතින  නීති කෘත්‍යයකට හෝ බලපානු නොලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**9.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.